**ප්‍රශංසා එකතු සුපුවත**

**2018 ජූලි මස 31 වන දින සිට අගෝස්තු මස 04 වන දින දක්වා**

**"අදහන්නා තුළින් ජීවනදායක ජල ධාරා ගලා යන්නේය."**

01. ආරම්භක ප්‍රශංසාව : පුබුදු ගී අංක 05 - "ඥාන වීර්ය ...."

02. ප්‍රශංසාවට හැඳින්වීම :

* "එබැවින් අහස් මඬල ඉක්මවා ගිය දෙවියන් වහන්සේගේ පුත්‍රයාණන් වන ජේසුස් නම් ශ්‍රේෂ්ඨ උත්තම පූජකයෙකු අපට සිටින නිසා අපේ ඇදහිල්ලේ නොසෙල්වී සිටිමු. මන්ද, අපට ඇත්තේ අපේ දුබලකම් ගැන අනුකම්පාවක් නැති උත්තම පූජකයකු නොව. සෑම අයුරින්ම අප වාගේ පරීක්ෂාවලට මුහුණ පෑ පාප රහිත උත්තම පූජකයෙකි." (හෙබ්‍රෙව් 3:14-15)

* ජේසුස් ක්‍රිස්තුන් වහන්සේව ජීවිතයේ සමිඳාණන් කරගත් අප ලබා ඇති ආශිර්වාදය මොන තරම් නම් බලගතුද? අපේ දුබලකම් ගැන අනුකම්පා කරන, හැම අයුරින්ම අප වාගේ පරීක්ෂාවලට මුහුණ පෑ සමිඳාණන් වහන්සේව මගේ ජීවිතයේ සමිඳාණන් කර ගන්නට මා මොන තරම් භාග්‍යවන්තයෙකු විය යුතුද? අපට උරුම වී ඇති දේව පුත්‍රභාවයේ උරුමය මත පිහිටා අද දවසේ ප්‍රශංසාවට ඇතුළු වෙමු.

* පුබුදු ගී අංක 150 - "ඔබෙන් තොරවූ මහ පොළොව පවා...."

03. ආපසු බැලීම :

* පසුගිය සති 04 තුළ ඔබට ලැබුණු සුපුවත තුළ ජීවත් වන්නට හැකි වීද? ළඟ සිටින කෙනෙකු සමඟ බෙදා ගන්න.

  - පළමු සතිය : දේව වචනය අසා පිළිපැදීමේ අවසාන පරමාර්ථය වන්නේ ආශිර්වාදය භුක්ති විඳීමයි.

  - දෙවන සතිය : යාච්ඤා ජීවිතය තුළින් දේව කැමැත්ත ඉටුකිරීමට පිපාස වෙමු.

  - තුන්වන සතිය : ඇවිලෙමින් අවුලන ශුද්ධාත්ම ගින්න

  - සතරවන සතිය : නිවිය නොහැකි ශුද්ධාත්ම ගින්නෙන් ඇවිළුණු ජීවිත තුළින් විහිදුනු ආලෝකය

04. දවසේ සුපුවත :

ශු. ජොහන් 5 : 24-27 - පොදුවේ ප්‍රකාශ කරන්න.

- ශු. ජොහන් 5:24 - **"දෙවියන් වහන්සේගේ වචනය අසා එය අදහන්නා හට සදාතන ජීවනය ලැබෙනු ඇත." ඔහුට විනිශ්චය නොපැමිණෙයි. ඔහු මරණයෙන් ජීවනයට පැමිණෙයි.**

- ශු ජොහන් 5:25 - **"සවන් දෙන අය ජීවත් වෙති."**

- ශු. ජොහන් 5:26 - **"පියාණන් වහන්සේට තමන් තුළම ජීවනදායක බලය තිබෙන්නාක් මෙන්ම, පුත්‍රයාණන්ටත් තමන් තුළම ජීවනදායක බලය ඇතිව සිටින්නට ඔවුන් වහන්සේ වරය දුන් සේක."**

05. වචනයේ සේවකයා සඳහා :

* දෙවියන් වහන්සේගේ වචනය අසා එය අදහමින් ජීවත් වූ ක්‍රිස්තුන් වහන්සේ හට පියාණන් වහන්සේ දානය කළ ආශිර්වාදය ජීවනදායක බලය ඇතිව සිටීමේ වරය ය.

* දේව වචනයේ බලය අත්දකින පුබුදු ජනතාවක් ලෙස අප ආ ගමන තුළ දෙවියන් වහන්සේගේ වචනය අදහන්නට අප ලද අනුග්‍රහය, ආශිර්වාදය කියා නිම කළ නොහැකිය. මනුෂ්‍ය දුර්වලකම්, අඩුපාඩු, පාපිෂ්ඨ අත්දැකීම් හරහා මනස්ථාපනය වෙමින් දෙවියන් වහන්සේගේ ආදරය වෙතට හැරෙන්නට දේව වචනය අපට මඟ දක්වා ඇත.

* දෙවියන් වහන්සේගේ වචනයට සවන් දෙන්නට, විවෘත වන්නට, ඒ තුළ ජීවත් වන්නට ශුද්ධාත්මයාණන් වහන්සේ අප තුළ අවුලන ගින්න දුර්පරික්ෂාවලින් අපව මුදවයි; විනිශ්චයෙන් ගැළවෙන්නට සලස්වයි.

* ජීවිත ප්‍රශ්න, ලෙඩ රෝග තුළ දේව වචනය සොයන්නට ශුද්ධාත්මයාණන් වහන්සේ අප තුළ අවුලන ගින්න නිදහස, ගැළවීම, සුවය අත්දකින්නට අපට වරය දෙයි.

06. ප්‍රායෝගිකව :

* දෙවියන් වහන්සේගේ වචනය අදහමින් ජීවත් වීම තුළ ලබන ආශිර්වාදිත අත්දැකීම් බෙදා ගනිමින් සාක්ෂි දරමු.

07. අවසාන ප්‍රශංසාව :
පුබුදු ගී 54 "ජීවනයේ ස්වාමිනී ......

**************************